# කුරුලු පවුලේ ගපන්කම



යූ. ජී. උසඳි සෙහන්සා රණවීර

# කුරුළු පවුලේ හපන්කම

**යූ. ජී. උසඳි සෙහන්සා රණවීර**

මහාමායා බාලිකා විදුහල

මහනුවර

# කුරුලු පවුලේ හපන්කම

© උසඳි සෙහන්සා

සියලුම හිමිකම් ඇවිරිණි

ප්‍රකාශිත දිනය - 2023/12/10

කර්තෘ අයිතිය සතු ය.

ISBN: 978-624-206-994-4

කතාව සහ සිතුවම්
යූ. ජී. උසඳි සෙහන්සා රණවීර

**කර්තෘගේ වෙනත් කෘති**

| | |
|---|---|
| කම්මැලි කූඹියා | (2023) |
| මගේ සුරතල් ටුංකූ | (2023) |

# පිදුම

මහාමායා බාලිකා විද්‍යාලයේ
සියලුම ගුරු මෑණිවරුන්ට
සහ පියවරුන්ට ද
මාගේ දෙමව්පියන්ට ද

මෙම පොත නිර්මාණය කර ගැනීම
සඳහා සහය දුන් සියලුම දෙනාට
පුද කර සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනා ගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීම යි. එම ජාතික අරමුණු මෙන් ම පාසලේ දර්ශනයට අනුව දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන් ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදායාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**

**විදුහල්පතිනිය**

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

2023/11/01

එකමත් එක කාලයක එක කැලයක කුරුල්ලෙකුයි කිරිල්ලියෙකුයි හිටියා. හැමදාම කුරුල්ලා ඒ කිරිල්ලිට කෑම ගේනවා මොකද ඒ කිරිල්ලී බිත්තර දමන්න තමයි හිටියේ.

ඉතින් ඒ නිසා කිරිල්ලි හොඳට කෑම කන්න ඕනනේ. ටික දවසකට පස්සේ කිරිල්ලි බිත්තර දැම්මා. ඊට පස්සේ ඒ කිරිල්ලි හොඳින් බිත්තර රැක්කා.



මේ හැම දෙයක් ම ඒ කැලේ තිබුණු කන්ද උඩ සිටිය නපුරු උකුස්සා බලාගෙන හිටියා. ටික දවසකට පස්සේ ඒ බිත්තර පුපුරලා පැටව් එළියට ආවා. මේ හැම දෙයක් ම බලාගෙන හිටිය නපුරු උකුස්සා ගැන මේ කුරුළු අම්මටයි තාත්තටයි සැක හිතුනා. ඉතින් එක දවසක් ඒ කුරුළු අම්මයි තාත්තයි කෑම හොයන්න යනවා සේ රඟපා අසල ගහකට ගොස් මුවාවී බලාගෙන සිටියා.



එයාලට සැක හිතුණු පරිදිම නපුරු උකුස්සා පැටව්ව කන්න ආවා. ඒ වුණත් ඒ උකුස්සා දැනගෙන හිටියේ නෑ කුරුලු අම්මයි කුරුලු තාත්තයි අසල ගහක සැඟවී බලාගෙන ඉන්නවා කියලා.

ඉතින් ඒ පැටව් කන්න කට අරිද්දිම කුරුලු අම්මයි කුරුලු තාත්තයි එසැණින් එතනට ඇවිල්ලා උකුස්සාට කොටන්න පටන් ගත්තා. ඉතින් උකුස්සාගේ හිස තුවාල වුණා.



ඊට පස්සේ ඒ නපුරු උකුස්සා වේදනාවෙන් අර කන්ද උඩට ඉගිලී ගියා. ඊට පස්සේ කවමදාවත් ඒ උකුස්සා ඒ කුරුළු පවුලට කරදර කරන්න ආවේ නෑ. ඉන්පසු ඒ කුරුළු පවුල සතුටින් ජීවත් වුණා.

**නිමි.**



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොට ගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන් ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක් ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවා යි පතමු...

**මෙයට,**
**සෙනෙවිරත්න මහලේකම්,**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක,**
2023/11/01